ඉඩම් කොමසාරිස් ජ ාල් දෙපාර්තමේන්තුව -
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහ කොමසාරිස් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112864051
ඊමේල් / ஈ-மெயில் / E-mail } landcom@landcommdept.g

මගේ අංකය / எனது இல / MY NO } 4/ 10/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / YOUR NO }

දිනය / திகதி / DATE } 2012.06.06

15 JUN 2012

චක්‍රලේඛ අංක : 2012/ 02

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**ඉඩම් රාජකාරි විධිමත් කිරීම**

ඉඩම් රාජකාරි ඉටුකිරීමේදී සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුවන නොයෙකුත් අක්‍රමිකතා හා නීතියට පටහැනි ක්‍රියා පිළිබඳව නිරන්තරයෙන් වාර්තාවේ. ඊට අදාලව මහජන පැමිණිලි, දේශපාලන අධිකාරියෙන් සහ විවිධ රාජ්‍ය ආයතනවලින් යොමු ලබන පෙන්වාදීම්ද නිරන්තරයෙන් දැකිය හැක. ගරු කථානායකතුමා විසින්ද මේ පිළිබඳව මාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස දන්වා ඇත. පහත සඳහන් ආකාරයේ කටයුතු මේ අතර කැපී පෙනේ.

I. ඉඩම් රාජකාරි ඉටුකිරීමේදී අණපනත් මගින් පනවා ඇති නීතිරීතිවලට සහ චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම.
II. ඉඩම් ආරවුල් බේරුම් කිරීමේදී සහ බෙදා දී ඇති ඉඩම්වලට අදාලව පසු කටයුතු සිදු කිරීමේදී ඉඩම් විෂයට අදාල නිලධාරීන්ගේ පුද්ගලික කැමැත්ත මත හෝ යම් පාර්ශවයන්ගේ බලපෑම් මත පක්ෂග්‍රාහීව ක්‍රියා කිරීම.
III. මා හෝ පළාත් ඉඩම් කොමසාරිස් වැනි අධිකාරියක් විසින් දෙනු ලබන තීරණ හෝ උපදෙස් නොසලකා හැරීම.
IV. නෛතික තත්ත්වයන් අධ්‍යයනය නොකර අත්තනෝමතික ලෙස තීරණ ගැනීම.
V. රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් සම්බන්ධයෙන් නොවලහා ක්‍රියා නොකිරීම සහ නිහඩ පිළිවෙතක් අනුගමනය කිරීම.

ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වරින් වර ඉඩම් විෂයයට අදාල පුහුණුවීම්ද ලබාදෙනු ලබන අතර චක්‍රලේඛ මඟින් අවශ්‍ය උපදෙස්ද නිරන්තරයෙන් ලබාදෙනු ලැබේ. ඒ හැර අවශ්‍ය පැහැදිලි කරගැනීම සඳහා කරනු ලබන විමසීම්වලටද උපදෙස් මවිසින් ලබාදෙනු ලැබේ. එහෙත් නෛතික ප්‍රතිපාදන අනුව නියමිත ක්‍රියාපටිපාටි අනුගමනය නොකර නිසි අනුමැතියකින් තොරව යම් යම් පාර්ශවයන් වෙත ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් ලබාදී ඇති අවස්ථාද වාර්තාවී ඇත. විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් පසුව යම් යම් අරමුණු සඳහා විශේෂ අත්තනෝමතික ලෙස ඉඩම් බෙදා දීම, චෙන්කර දීම සහ බලපත්‍ර ලබාදීම් සිදුවන බවද වාර්තාවී ඇත. එම ප්‍රදේශවල ජනතාවගේ ඉල්ලීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් හිතාමතාම පැහැර හරින අවස්ථාවන්ද නිරන්තරයෙන් වාර්තාවේ.

ඉඩම් විෂයට අදාලව නීතියෙන් ඔබ වෙත ලබා දී ඇති බලතල විධිමත් ලෙස යොදා ගනිමින් හා ඊට අදාල රෙගුලාසි, නියෝග, චක්‍රලේඛ ආදියේ උපදෙස් නිසි පරිදිව අනුගමනය කරන ලෙස දැඩිව අවධාරණය කරමි. ඊට පටහැනිව ක්‍රියා කරනු ලබන නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම සඳහා අදාල විනය බලධාරීන්

වෙත වාර්තා කිරීමට කටයුතු කරන බවද දන්වමි. ඔබ වෙත අනුයුක්ත කර ඇති මෙම දෙපාර්තමේන්තුවේ හෝ පලාත් සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධයෙන් එවැනි අක්‍රමිකතාවයක් වාර්තා වුවහොත් වහාම අදාල පත්වීම් බලධාරියා වෙත ඒ පිළිබඳව වාර්තා කරන ලෙසද දන්වමි. එවැනි වැරදි ක්‍රියාවලට වගකිව යුතු යම් නිලධාරියකු අදාල සේවා ස්ථානයෙන් ස්ථාන මාරුවී ගොස් තිබුණේ වුවද අදාල නිලධාරියා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට වත්මන් විනය බලධාරියා වෙත වාර්තා කිරීමට ක්‍රියා කරන බවද සලකන්න.

රජයේ ඉඩම් අනවසර අල්ලාගැනීම පිළිබඳව ග්‍රාම නිලධාරී වාර්තා නිරන්තරයෙන් ලබාගෙන අප්‍රමාදව ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවත් එසේ වාර්තා නොකරන ග්‍රාම නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් කෙරෙහි අවධානය යොමු කරන ලෙසද දන්වමි. තවද රජයේ ඉඩම්වලට ව්‍යාජ ප්‍රකාශන ඔප්පු සකස් කර ලියාපදිංචි කිරීම වැළැක්වීම සඳහා දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය නීතිමය පියවර ගතයුතු බවද එවැනි ලියාපදිංචි කිරීම් පිළිබඳ හෙළිදරව් වූ විට අදාල ඉඩමේ තවදුරටත් පැවරීම වැළැක්වීම සඳහා කේවියට තහනමක් ලියාපදිංචි කර අනතුරුව අනෙකුත් නීතිමය පියවර ගැනීමත් කළ යුතු බවද තවදුරටත් දන්වමි.

ඉඩම් බෙදා දීමේදී වඩාත් විනිවිදභාවයකින් කටයුතු කිරීම තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය හා ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලෙසද දන්වමි.

ඉහත දැක්වූ තත්ත්වය පිළිබඳව රජයේ ප්‍රතිපත්ති සම්පාදන මට්ටමේ විශේෂ අවධානය යොමුවී ඇති හෙයින් මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ඉදිරියේදී විශේෂ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සිදුවිය හැකි බවද පෙන්වා දෙමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්

1. ගරු කථානායකතුමා - දැ.ස.
2. ජනාධිපති ලේකම් - දැ.ස.
3. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - දැ.ස.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශකටයුතු අමාත්‍යාංශය - දැ.ස.
5. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - දැ.ස.
6. පලාත් ඉඩම් කොමසාරිස්වරු - අ.කා.ස.
7. ඉඩම් කොමසාරිස් (ඉඩම්/ සංවර්ධන/ මුදල්) - දැ.ස.
8. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (ඉඩම්/ සංවර්ධන/ රන්බිම/ නීති) - දැ.ස.